පරයේෂණ ක්ෂේත්‍රයේ 81 වසරක අභිමානය
81 வருட ஆய்வின் சாதனை
81 Years of Research Achievement

# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391 - 6785
සය වන කාණ්ඩය, පළවන කලාපය 2006 ජනවාරි - ජූනි

# තේ වගාවේ තිරසාර අස්වැන්නකට ගැඩවිලි කොම්පෝස්ට් භාවිතය



තේ පැල සඳහා ගැඩවිලි කොම්පෝස්ට් භාවිතය

තෙ' ඉඩම් වලින' වැඩි ඵලදායිතාවයක් හා තිරසාර අස්වැන්නක් ලබා ගැනීම සඳහා නිසි අයුරින් පොහොර භාවිතා කල යුතුය. ඒ සඳහා රසායනික පොහොර කොතරම් භාවිතා කලද නිසි ගුණාත්මක අස්වැන්නක් ලබා ගැනීම සහ පසේ භෞතික හා ජෛවීය තත්වයන් දියුණු කල නොහැකිය. නමුත් රසායනික පොහොර වලට අමතරව කාබනික පොහොරක් ලෙස ගැඩවිලි කොම්පෝස්ට් භාවිතා කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගත හැකිවේ. එමගින් පසට හියුමස් එකතුවී පැලෑටි පෝෂක රඳවා ගැනීමේ හැකියාව වැඩි කරයි. මේ නිසා පසට යොදනු ලබන රසායනික පොහොර වලින්ද උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වන අතර පසේ ජලය සහ වාතය රඳවා ගැනීමේ හැකියාව වර්ධනය වීම සහ පසේ හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය ඉහල මට්ටමක පවත්වා ගැනීමට පුළුවන. ගැඩවිලි කොම්පෝස්ට් යනු ප්‍රධාන වශයෙන් ගැඩවිලුන් විසින් ආහාරයට ගනු ලබන කාබනික ද්‍රව්‍ය ජීර්ණය කිරීමෙන් ලැබෙන බහිස්‍රාවීය කොටස් වන අතර බැක්ටීරියා හා දිලීර ක්‍රියාකාරීත්වයද මේ තුල සිදුවේ. කාබනික පොහොර වර්ග අතර ගැඩවිලි කොම්පෝස්ට් වල සෑහෙන ප්‍රමාණයක් මහා පෝෂක මූල ද්‍රව්‍ය අඩංගු වන අතර ක්ෂුද්‍ර පෝෂක මූල ද්‍රව්‍ය වලින් ද ගහණය. ඒ අතරම මෙහි ඇති විශේෂත්වය වන්නේ විටමින් වර්ග, එන්සයිම, ප්‍රතිජීවක සහ ශාක වර්ධක හෝමෝන වර්ග අඩංගු වීමය. මේ මගින් ශාකයේ වර්ධනය වේගවත් කිරීම රෝග සහ පලිබෝධ (නෙමටෝඩාවන්) වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම සහ උසස් ගුණාත්මයකින් යුතු වැඩි අස්වැන්නක් ලබා දීම සිදුවේ.

## ගැඩවිලි කොම්පෝස්ට් නිපදවා ගැනීම

•

මේ සඳහා වැස්ස හිරුඑළිය නොවැටෙන පොල් අතු වලින් සෙවිලි කළ, කළු පොලිතින් වලින් වටේට ආවරණය කරන ලද අඳුරු මඩුවක් භාවිත කල හැක. කොම්පෝස්ට් නිපදවීමේ අමුද්‍රව්‍ය ලෙස පහසුවෙන් සොයා ගත හැකි ගෝතමාලා, ලාඩප්පා, වල්සූරිය කාන්ත, කුරිඤ්ඤ, එරබදු අඬනහිරිය, කැප්පිටියා, කැලියැන්ඩ්‍රා වැනි ශාක වල කොල අතු ඉවතලන එළවළු සහ පලතුරු කොටස්, පිදුරු, කසල තේ සහ මල් පිපීමට පෙර ගැලවූ විවිධ වල් පැලෑටි වර්ග අමු ගොම හෝ එළු බෙටි වැනි ද්‍රව්‍ය සහ ජලය අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් අමු කොල අතු කි.ග්‍රෑ. 100 ක් සඳහා අමු ගොම කි.ග්‍රෑ 30 ක් පමණ අවශ්‍ය වේ. ගැඩවිලි පණුවන් ලෙස කාබනික ද්‍රව්‍ය වැඩියෙන් ආහාරයට ගන්නා පොලව මතුපිට ස්වභාවිකවම සිටින ගැඩවිලි පණුවන් (ගොම පොහොර වල සිටින රතු දම් පාටට හුරු *Eisenia foetida* සහ *Eudrilis eugeniae* වැනි කුඩා පණු විශේෂ) යොදා ගත හැකිය. අඳුරු පැහැයට හුරු පස් වැඩියෙන් ආහාරයට ගන්නා ලොකු ගැඩවිලි විශේෂ නුසුදුසුය.



කාබනික අපද්‍රව්‍ය මත සැපෙන ගැඩවිලි පණුවන්

# තේ තතු

පරයේෂණ ක්ෂේත්‍රයේ 81 වසරක අභිමානය
81 வருட ஆய்வின் சாதனை
81 Years of Research Achievement

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391 - 6785
සය වන කාණ්ඩය, පළවන කලාපය 2006 ජනවාරි - ජූනි





## පියවර

ගැඩවිලි පණුවන් පොලව තුලට රිංගා යාම වැලැක්වීම සඳහා පළමුවෙන්ම පොලිතින් කවරයක් බිම අතුරන්න. පහත සඳහන් ආකාරයට කාබනික අප ද්‍රව්‍ය හෝ කොළඅතු සහ ගොම දියර තට්ටු මීටර් 1 ක් පමණ උසට ඒකාන්තරව අසුරන්න. පසුව ගොම හෝ මැටි තට්ටුවකින් වසන්න. දින 3 කට වතාවක් වත් වතුර ඉසින්න. දින 20ක් පමණ මෙසේ අසුරා තබා ඇතුලත උෂ්නත්වය අඩුවූ විට ගැඩවිලි පණුවන් 500-750 ක් පමණ ගොම හෝ මැටි තට්ටුව මතට එකතු කරන්න. ඊට පසු කුඹින්ගෙන් සහ කුරුල්ලන්ගෙන් පණුවන් ආරක්ෂා කිරීම සඳහා පිදුරු/මානා/සැවන්දරා හෝ ගෝනි දැලකින් වසන්න. මෙලෙස පණුවන්ට අවශ්‍ය උෂ්නත්වය හා ආර්ද්‍රතාවය පවත්වා ගැනීම සඳහා ජලය යොදමින් මාස 2 -3 පමණ තිබෙන්නට හරින්න. පසුව නිපදවූ කොම්පෝස්ට් වෙන් කර කේතුවක ආකාරයට ගොඩ ගසා පැය 2-3 පමණ තබන්න. එවිට පණුවන් පහත ස්ථරයට ගමන් කරයි. උස කොටස වෙන් කර යට කොටසේ ඇති පණුවන් ඊලඟ කොම්පෝස්ට් වටය සඳහා ප්‍රයෝජනයට ගන්න. මෙලෙස සාදාගත් ගැඩවිලි කොම්පෝස්ට් කළු දුඹුරු පැහැතිය. ප්‍රසන්න සුවඳක් සහ සියුම් වයනයක් ගනියි. බර ගතියෙන් අඩුය. සාමාන්‍යයෙන් අමු කොල අතු සහ එළු බෙටි 1:1 අනුපාතයෙන් යෙදූ මිශ්‍රණයේ කි.ග්‍රෑ 100 කින් ගැඩවිලි කොම්පෝස්ට් කි.ග්‍රෑ. 35-40 පමණ ලබා ගත හැකි අතර ඒ සඳහා අඩු ශ්‍රමයක් වැයවේ.




මෙහි කාබන්, නයිට්‍රජන්, පොටැසියම් වැඩි ප්‍රමාණයක් ඇති නිසා පස සාරවත් කරයි. සාමාන්‍යයෙන් තේ පැලයකට අවුරුද්දකට T 200 සමහ ගැඩවිලි කොම්පෝස්ට් ග්‍රෑ 300 ක් 6 වතාවක් යෙදීමෙන් තේ පැළ ඉතා නිරෝගී ලෙස සහසරුසාරව වැඩෙන අතර දළු නෙලන අවධියේදී තේ ගසකට අවුරුද්දකට T 750 සමහ ගැඩවිලි කොම්පෝස්ට් ග්‍රෑ 300 ක් 04 වතාවක් යෙදීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැක.


එම්. ජ්. සාන්ත ලියනගේ සහ
ආචාර්ය කපිල ගාමිණි ප්‍රේමතිලක